# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1816/30 - 2013 ජුනි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඉඩම් සංවර්ධන ආඥාපනත**

1969 අංක 16 දරන පනතින්, 1981 අංක 21 දරන පනතින්, 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 09 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 හා 156 වගන්ති යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ එකී පනතේ 157 වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රෙගුලාසි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 14 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර", 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2012 ඉඩම් සංවර්ධන රෙගුලසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන ආඥාපනතේ 162(1) වගන්තියේ දැක්වෙන පරිදි දීමනා පත්‍රයක් මත දුන් ඉඩමක් බැහැර කරවනු ලබන ලියවිලි මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැනිව සකසා ඇති අවස්ථාවක ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් එම ලේඛන බල රහිත බවට කරනු ලබන ප්‍රකාශය පහත 'අ' ඇමුණුම පරිදි විය යුතුය.

'අ' ඇමුණුම

ඉඩම් රෙජිස්ට්‍රාර්,
........................................................,
පෙර ලියාපදිංචිය ................................

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 42 හා 162(2) වන වගන්තිය යටතේ ප්‍රකාශිත ලේඛනය**

..............................................................ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල් වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත I උපලේඛනයේ දැක්වෙන, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 37 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට බැඳෙමින් 19(4) වගන්තිය යටතේ ප්‍රදාන පත්‍රයක් මත ලබාදුන් ඉඩමෙන්, පහත දැක්වෙන II



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනයේ දක්වා ඇති ඉඩම් සඳහා සකස් කරන ලද්දා වූ ලේඛනය ඉඩම් සංවර්ධන ආඥාපනතේ 162(1) වගන්ති යටතේ වූ විධිවිධාන උල්ලංඝනය වන පරිදි ලියා සහතික කරන ලද ලේඛනයක් බවට මා සෑහීමකට පත් වූ හෙයින්, ඉහත කී පනතේ 42 වන හා 162(1) වගන්ති යටතේ එකී II වන උපලේඛනය සඳහා ලියා සහතික කරන ලද ලේඛනය බල රහිත බවට ප්‍රකාශ කරමින් මෙම ලේඛනය ලියා සහතික කරමි.ච

I උපලේඛනය

II උපලේඛනය

දිනය : ..........................................................

..........................................................................
ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල්,

07 - 329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.